**ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 05 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ සිට 2.7 දක්වා ඡේදවල සඳහන් කර ඇත.

මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබූ බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරියාගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී විසින් එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ නියමිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම. | 2.1.1 |
| 128(1)(ආ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදි ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.<br>2. අභ්‍යන්තර විගණනය පිහිටුවා නොතිබීම. | 2.6<br>2.7 |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය කලින් කල සෝදිසි කරන බව. | ගබඩා අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.5 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර නොගැනිම. | 2.4.1 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා | අයි ප්‍රතිපාදන සලසා | 2.2 |

| | |
|---|---|
| වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත් කරනු ලබන බව. (මුදල් රෙගුලාසි 150) | තිබීම. |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 කාර්යසාධනය**

**2.1.1 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ යුතු ප්‍රධාන කාර්යයන් 11 ක් පැවති අතර, එම කාර්යයන් අතර වූ හඳපානාගල ව්‍යාපෘතිය හා තොණ්ඩමන් ආරු ව්‍යාපෘතිය පිළිවෙලින් 2017 සැප්තැම්බර් 30 දින හා 2017 ඔක්තෝබර් 30 දින වැඩ අවසන් කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ භෞතික කාර්යසාධනය පිළිවෙලින් සියයට 83 හා සියයට 60 විය.

**2.2 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **සියයට** |
| 2013 | පුනරාවර්තන | 55.25 | 54.53 | 0.72 | 1.30 |
| | මූලධන | 318.86 | 128.42 | 190.44 | 59.72 |
| | **එකතුව** | **374.11** | **182.95** | **191.16** | **51.09** |
| 2014 | පුනරාවර්තන | 63.27 | 60.62 | 2.65 | 4.19 |
| | මූලධන | 145.35 | 125.75 | 19.60 | 13.48 |
| | **එකතුව** | **208.62** | **186.37** | **22.25** | **10.66** |
| 2015 | පුනරාවර්තන | 79.37 | 75.56 | 3.81 | 4.80 |
| | මූලධන | 152.20 | 86.75 | 65.45 | 43.00 |
| | **එකතුව** | **231.57** | **162.31** | **69.26** | **29.90** |
| 2016 | පුනරාවර්තන | 90.63 | 76.97 | 13.66 | 15.07 |
| | මූලධන | 51.69 | 51.37 | 0.32 | 0.62 |
| | **එකතුව** | **142.32** | **128.34** | **13.98** | **9.82** |
| 2017 | පුනරාවර්තන | 100.26 | 98.66 | 1.60 | 1.59 |
| | මූලධන | 58.15 | 57.73 | 0.42 | 0.72 |
| | **එකතුව** | **158.41** | **156.39** | **2.02** | **1.27** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

**--------------------------------**

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ඉක්ම වූ ප්‍රමාණයක් ගෙන තිබුණි.

**2.3 බැරකම්**

**---------**

මුදල් රෙගුලාසි 94 පරිදි ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීමට නොහැකි වුවත් දෙපාර්තමේන්තුව වැය විෂයයන් 07 කට අදාළව එකතුව රු.2,753,923, කින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැඳී තිබුණි.

**2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**----------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**-------------------------------------------------**

කර්මාන්තශාලාවට අදාල විෂය අංක 31001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 38.00 | 37.43 | 26.00 | 30.87 | 125.00 | 89.35 |

**2.4.1 හිඟහිටි ණයශේෂ අයකර නොගැනීම**

**----------------------------------------**

විගණනයට ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අය විය යුතු ණය ශේෂ හැර ශේෂය රු.1,818,326 ක් වූ අතර එම ශේෂයෙන් රු.1,377,016 ක් වර්ෂ තුනකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ වූ අතර ඉන් රු.930,211 ක් වර්ෂ 05 ට වැඩි කාලයක සිට පැවත එමින් පවතින හිඟ හිටි ණය ශේෂ විය.

**2.5 ගබඩා අත්තිකාරම් ගිණුම**

**--------------------------**

**2.5.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ගබඩා අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.14,267,357 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.880,770 ක් වූයෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.13,386,586 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(අ) සැපයුම් සඳහා මුදල් ගෙවීමේදී ඉන්වොයිසියේ සඳහන් මුදලට වඩා වෙනස් මුදලක් ගෙවීම් සිදු කළ අවස්ථාවන්හිදී එම ගෙවීම්වලට අදාල සංශෝධිත ඉන්වොයිස් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අවස්ථා විය.

(ආ) සමාලෝචිත වර්ෂය ඇතුළු පසුගිය වර්ෂ කිහිපයක සිට ගබඩා අත්තිකාරම් කටයුත්තෙහි ගනුදෙනු පිළිබඳ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

(ඇ) ගැණුම් සටහන් කිරීම සඳහා විධිමත් දෛනික ගැණුම් ජර්නලයක් පවත්වා නොතිබුණු අතර අත්පිට ගැණුම් සහ ණයට ගැණුම් වෙන්, වෙන් වශයෙන් උපයෝගී ලේඛනවල ඇතුළත් කර මාසිකව ජර්නල් සටහන් මගින් පොදු ලෙජරයේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) දෛනිකව නඩත්තු කරනු ලබන ණය හිමි ලෙජරයක් විධිමත්ව පවත්වා නොතිබුණි.

## 2.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, අනෙකුත් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (ආ) | උප පත්‍රිකා ලේඛනය | මුදල් රෙගුලාසි 341 | පවත්වා නොතිබුණි. |
| (ඇ) | විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | පවත්වා නොතිබුණි. |
| (ඈ) | පුද්ගල පඩිනඩි ලේඛනය | මුදල් රෙගුලාසි 453 | පවත්වා නොතිබුණි. |
| (ඉ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලින කර නොතිබුණි. |
| (ඊ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය / මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාරව එහි 11 වැනි පරිශිෂ්ටය | යාවත්කාලින කර නොතිබුණි. |
| (උ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |

## 2.7 අභ්‍යන්තර විගණනය

රජයේ කර්මාන්තශාලාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

### 2.8.1 අනුයුක්ත කාර්යමණ්ඩලය, තථ්‍ය කාර්යමණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.68,164,106 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.149,811 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 31 | 17 | 14 | - |
| (ii) | තෘතියික මට්ටම | 10 | 02 | 08 | - |
| (iii) | ද්විතියික මට්ටම | 197 | 119 | 78 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 552 | 316 | 236 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත්පදනම ) | - | 1 | - | 1 |
| | එකතුව | 790 | 455 | 336 | 1 |